# විශේෂ දැනුම් දීමයි

## විශ්වවිද්‍යාල සිසුන් අතර ඉන්ෆ්ලුවෙන්සා (Influenza) වෛරස් රෝගය පැතිරයාම සම්බන්ධව

මේ දිනවල විශ්වවිද්‍යාල සිසුන් අතර ඉන්ෆ්ලුවෙන්සා (Influenza)වෛරස් රෝගය පැතිර යමින් පවතින බැවින්, ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස සියලුම සිසුන්ට දැනුම් දෙනු ලැබේ.

**රෝග ලක්ෂණ**

- උණ
- සෙම්ප්‍රතිශ්‍යාව
- කැස්ස
- හිසරදය
- සමහර අවස්ථාවල වමනය

මෙම රෝගය පිළිබඳව අනවශ්‍ය බියක් ඇති කර නොගෙන, රෝගය වැළැක්වීමට සහ එය තවදුරටත් පැතිරීම පාලනය කිරීමට පහත උපදෙස් පිළිපදින ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

**අනුගමනය කළ යුතු උපදෙස්**

- රෝග ලක්ෂණ ඇති වූ වහාම වෛද්‍ය උපදෙස් ලබාගන්න.
- රෝගී කාලය තුළ මුඛ ආවරණයක් පළඳින්න.
- රෝගී කාලය තුළ ප්‍රමාණවත් තරම් ජලය සහ උණුසුම් දියර වර්ග පානය කරන්න.
- සබන් හා ජලය භාවිතයෙන් නිතර අත් සෝදන්න.
- කැස්ස හෝ කිවිසුම් යන විට නාසය සහ මුඛය ආවරණය කරන්න.
- රෝග ලක්ෂණ පවතින කාලය තුළ හැකිතාක් අනෙකුත් පුද්ගලයන්ගෙන් ඈත්ව සිටින්න.
- **දේශන ශාලා සහ අනෙකුත් පොදු ස්ථානවල ගැවසෙන විට මුඛ ආවරණයක් පළඳින්න.**
- **විශේෂයෙන්ම රෝග ලක්ෂණ ඇති විට පොදු ස්ථානවල ගැවසීමෙන් වළකින්න.**

වෛද්‍ය මධ්‍යස්ථානය
12.10.2026